කොළඹ විශ්ව විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය

පළමු සෙමෙස්තරය 2022/2023

ECN 1101: මූලික සූක්ෂම ආර්ථික විද්‍යාව

කාලය පැය 2කි.

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

ගණක යන්ත්‍ර භාවිතා කළ හැකිය. ප්‍රස්තාර කොළ සපයනු ලැබේ

---

1

අ) මිල රුපියල් 5 දී ඉල්ලුම 100 හා අධි ඉල්ලුම 45ක් වේ. මිල රුපියල් 15 දී සැපයුම 115 හා අධි සැපයුම 45 වේ.

i. පහත දී ඇති වගුව පුරවන්න. (ලකුණු 4)

| මිල | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| 5 | | |
| 15 | | |

ii. ඉල්ලුම් සමීකරණය සොයන්න (ලකුණු 4)

iii. සැපයුම් සමීකරණය සොයන්න (ලකුණු 4)

iv. සමීකරණ දෙක යොදා ගනිමින් සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න (ලකුණු 4)

ආ) X නම් නිෂ්පාදිතය පිළිබඳ විස්තර පහත දී ඇත.

Q = 0 දී P = 10

මිල 5 දී

පාරිභෝගික අතිරික්තය 160

සමතුලිත ප්‍රමාණය කුමක් වේද? (ලකුණු 5)

ඇ) රන්ජිත්ගේ ආදායම ඉහළ යයි. ඔහුගේ ආදායම ඉහළ ගියත් ඔහු X නම් භාණ්ඩය මිලදී ගැනීම අඩු කරයි. X නම් භාණ්ඩය පිළිබඳව අපට කුමක් නිගමනය කළ හැකි ද? මෙම අවස්ථාවේදී X හි ආදායම් ඉල්ලුම් නම්‍යතාවය පිළිබඳ අපට කුමක් කිව හැකිද? (ලකුණු 4)

2.

අ) $Q_d = 100 - 2P$

$Q_s = 40 + P$

i. දී ඇති මිල ගණන් සඳහා ඉල්ලුම් හා සැපයුම් වගුව පුරවන්න.

| මිල | ඉල්ලුම | සැපයුම |
|---|---|---|
| 10 | | |
| 30 | | |
| 60 | | |

(ලකුණු 5)

ii. ප්‍රස්තාරයක් භාවිතා කරමින් සමතුලිත මිල හා ප්‍රමාණය සොයන්න. (ලකුණු 6)

ආ) පහත දී ඇති ක්‍රියාවලීන්, සඳහන් කළ භාණ්ඩයේ වෙලෙළඳපොළට ඇතිකරන බලපෑම් රූප සටහන් යොදා ගනිමින් සාකච්ඡා කරන්න.

i. සිගරට් මත ඒකක බද්දක් පැනවීම.
ii. රජය හාල් වෙළෙඳපොළ ආශ්‍රයෙන් පාලන මිලක් පැනවීම.

(එක් කොටසකට ලකුණු 4)

ඇ) පහත දී ඇති සංකල්ප සැපයුමට බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

i. ගබඩාකරණයේ පිරිවැය
ii. තාක්ෂණික ප්‍රගතිය

(එක් කොටසකට ලකුණු 3)

3.

අ) රවී රැකියාවක් කරනුයේ පැයකට ගෙවීම් ලබන කම්කරුවකු වශයෙනි. රාජා රැකියාවක් කරනුයේ පෞද්ගලික අංශයේ විශේෂඥ වෛද්‍යවරයෙකු වශයෙන් වන අතර ඔහුද වැටුප් ලබනුයේ පැයකට කරන ගෙවීම් වශයෙනි. අක්ෂවල පැයකට වැටුප හා දිනකට වැඩ කරන පැය ගණන ලකුණු කොට එක් එක් පුද්ගලයා සඳහා ශ්‍රම සැපයුම් වක්‍රයක් අඳින්න. මෙම ශ්‍රම සැපයුම් වක්‍ර දෙක එකිනෙකට වෙනස් හැඩයන් ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 5)

ආ) මෙම එක් එක් අවස්ථාවේ දී වාණිජ බැංකුවලට වලට ඔබ දෙන අවවාදයන් දක්වන්න.

i. ඉහළ උද්ධමනයක් පවතින අවස්ථාවක බැංකුවට ඉතිරිකිරීම් ප්‍රසාරණය කිරීමට අවශ්‍ය වීම.
ii. ඉහළ අවිනිශ්චිතතාවයක් පවතින අවස්ථාවක බැංකුවට ඔවුන් දෙන ණය අරමුදල් ආරක්ෂා කිරීමට අවශ්‍ය වීම.

(එක් කොටසකට ලකුණු 4)

ඇ) ප්‍රතිචක්‍රිත කඩදාසි (Recycle Papers) නිපදවන යන්ත්‍රයක මිල රුපියල් 800,000කි. මෙම යන්ත්‍රය මිලදී ගැනීමට ව්‍යවසායකයාට මුදල් නොමැති බැවින් 10% පොලියට ණයක් ගැනීමට ඔහුට සිදුවේ. යන්ත්‍රය මිලදී ගන්නේ 0 වසරේය. ව්‍යවසායකයා එක් එක් වසර අවසානයේ ලබාගත හැකි ආදායම් පුරෝකතනය කරයි

වසර 1 300,000

වසර 2 350,000

වසර 3 400,000

වට්ටම් අනුපාතය 5%

පළමුව, වසර තුන සලකා ගෙවිය යුතු වැල් පොළී අගය ගණනය කරන්න.(0 වසර සඳහා පොළී වියදමක් නැත)

දෙවනුව, ප්‍රතිචක්‍රිත කොළ නිෂ්පාදනයෙන් ලද හැකි මුළු ආදායම ගණනය කරන්න. (ගණනයේදී යොදා ගන්නා පියවර පැහැදිලිව ඉදිරිපත් කරන්න.)

පසුව ව්‍යවසායකයා යන්ත්‍රය මිලදී ගත යුතු දැයි තීරණය කරන්න. (ලකුණු 12)

4.

ආ)

i. පහත දී ඇති වගුව (දිනකට නිපදවන සැපයුම) පුරවන්න. මෙම භාණ්ඩ ඒකකයක් රුපියල් සියය බැගින් විකුණන බව උපකල්පනය කරන්න.

| ශ්‍රමය | මුළු නිමැවුම | ආන්තික නිමැවුම | ආන්තික නිමැවුමේ වටිනාකම |
|---|---|---|---|
| 1 | 12 | | |
| | | | |
| 2 | 42 | | |
| | | | |
| 3 | 69 | | |
| | | | |
| 4 | 89 | | |
| | | | |
| 5 | 104 | | |

(ලකුණු 5)

ii. ශ්‍රමිකයන් සංඛ්‍යාව ඉහළ යන විට ආන්තික ඵලදාවට ඇති වන බලපෑම හඳුනාගෙන එවැනි ප්‍රතිඵලයක් ඇති වීමට හේතුව පැහැදිලි කරන්න. (ලකුණු 4)

iii. දෛනික වැටුප ශ්‍රම වෙළඳපොලට අනුව රුපියල් 2000 ක් වශයෙන් තීරණය වුවහොත් ශ්‍රමිකයන් කීදෙනෙකු සේවා නියුක්ත කළයුතුද? (ලකුණු 5)

ආ) සමාගමක් සපත්තු නිෂ්පාදනයේ නියැළෙන අවස්ථාවක් සලකන්න.

A නිෂ්පාදන ශිල්ප ක්‍රමය ශ්‍රම ඒකක 5ක් හා ප්‍රාග්ධනය ඒකක 2ක් යොදා ගනියි.

B නිෂ්පාදන ශිල්ප ක්‍රමය ශ්‍රම ඒකක 2ක් හා ප්‍රාග්ධනය ඒකක 5ක් යොදා ගනියි.

ව්‍යවසායකයා ශ්‍රම සූක්ෂම ශිල්ප ක්‍රමය යොදා ගැනීමට තීරණය කරයි.

i. ඉහත අවස්ථාවේ කුමන නිෂ්පාදන ශිල්ප ක්‍රමය ශ්‍රම සූක්ෂම ශිල්ප ක්‍රමය වේද?
ii. එක් ශ්‍රම ඒකකයකට හා එක් ප්‍රාග්ධනය ඒකකයකට මේ අවස්ථාවේ අදාළ වන මනංකල්පිත වටිනාකම් යොදා ගැනීම තුළින් ව්‍යවසායකයාගේ තීරණය සනාථ කරන්න.
iii. ඉහත දී ඇති කරුණු අනුව මෙම කර්මාන්ත ශාලාව පිහිටා ඇත්තේ කුමන ආකාරයේ රටකද?

(එක් කොටසක්ට ලකුණු 2)

ඇ) සමාගමකට සිය නිමැවුම ඉහළ දැමිය හැකි විවිධ ක්‍රම ලැයිස්තුගත කරන්න. (ලකුණු 5)

5.

අ) පහත වගුවෙහි ඇති සියලුම කොටු පුරවන්න.

| නිමැවුම | ස්ථාවර පිරිවැය (FC) | විචල්‍ය පිරිවැය (VC) | මුළු පිරිවැය (TC) | සාමාන්‍ය ස්ථාවර පිරිවැය (AFC) | සාමාන්‍ය විචල්‍ය පිරිවැය (AVC) | සාමාන්‍ය මුළු පිරිවැය (ATC) |
|---|---|---|---|---|---|---|
| 0 | 50 | | | | | |
| 1 | | 50 | | | | |
| 2 | | 78 | | | | |

(ලකුණු 12)

ආ) 'විස්තෘත බලපෑම' හා 'හීනවන ආන්තික ඵලදාව' යන සංකල්ප යොදා ගනිමින් කෙටි කාලයේ දී සාමාන්‍ය මුළු පිරිවැය (ATC) වක්‍රය U වක්‍රයක හැඩය ගැනීම පැහැදිලි කරන්න. (ලකුණු 6)

ඇ) දී ඇති දත්ත ආශ්‍රයෙන් මෙම වගුව පුරවා ඒකාධිකරුවකුගේ සාමාන්‍ය අයභාර (AR) හා ආන්තික අයභාර (MR) වක්‍රයන්හි බෑවුම් අගයන් සොයන්න. ආන්තික අයභාර (MR) වක්‍රය සාමාන්‍ය අයභාර (AR) වක්‍රය මෙන් දෙගුණයක් තිව්‍ර බව ඔප්පු කරන්න.

| මිල (P) | ප්‍රමාණය (Q) | මුළු අයභාරය (TR) | ආන්තික අයභාරය (MR) |
|---|---|---|---|
| 5 | 60 | | |
| | | | |
| 4 | 70 | | |
| | | | |
| 3 | 80 | | |

(ලකුණු 7)

6.

අ) පහත දී ඇති කියමන් හරිද වැරදිද? ඔබ හරි යයි පිළිතුරු දුනහොත් කියමන සනාථ කරන්න. වැරදි යැයි පිළිතුර දුනහොත් කියමන නිවැරදි කරන්න.

i. පූර්ණ තරඟකාරය යටතේ නිෂ්පාදකයන් සෑම විටම අති ප්‍රාමාණික ලාභ ලබයි.

ii. පූර්ණ තරඟකාරය යටතේ නිෂ්පාදකයන් හා පාරිභෝගිකයන් මිල ගන්නන් ය.

(එක් කොටසකට ලකුණු 4)

ආ) සමාගමක් කෙටි කාලයේ හා දිගු කාලයේ පවතින මිල තත්ත්වයන් මෙනෙහි කරයි. මිල තත්ත්වයන් පහත දී ඇත.

දිගු කාලයේ සාමාන්‍ය පිරිවැය = 14
කෙටි කාලයේ සාමාන්‍ය ස්ථාවර පිරිවැය = 8
කෙටි කාලයේ සාමාන්‍ය විචල්‍යය පිරිවැය = 7
කෙටි කාලයේ සාමාන්‍ය පිරිවැය = 15

පහත වගුවේ දී ඇති එක් එක් මිලයන් යටතේ ව්‍යවසායකයා කෙටි කාලයේ දී හා දිගු කාලයේ දී ගන්නා තීරණ සඳහන් කරන්න.

| | කෙටි කාලය | දිගු කාලය |
|---|---|---|
| P = 16 | | |
| P = 6 | | |
| P = 14 | | |
| P = 10 | | |

(ලකුණු 8)

ඇ) පිරිවැය වක්‍ර රූප සටහන් යොදා ගනිමින් පහත දී ඇති තත්ත්වයන් නිරූපණය කරන්න.

i. ප්‍රාමාණික ලාභ අවස්ථාව (ලකුණු 4)

ii. කෙටිකාලීන සැපයුම් වක්‍රය නිර්මාණය කරගන්නා ආකාරය (ලකුණු 5)

7.

අ) මිල බලපෑම හා ප්‍රමාණ බලපෑම යන සංකල්ප යොදා ගනිමින් ඒකාධිකරුවා ප්‍රමාණය 20 සිට 30 ට වෙනස් කළ යුතු දැයි තීරණය කරන්න.

| මිල | ප්‍රමාණය |
|---|---|
| 5 | 10 |
| 4 | 20 |
| 3 | 30 |
| 2 | 40 |

(ලකුණු 4)

ආ)

i. ඒකාධිකරුවකුට අදාළ වන සාමාන්‍ය අයභාරය හා ආන්තික අයභාර වක්‍ර අඳින්න. ආන්තික පිරිවැය (MC) වක්‍රය තිරස් රේඛීය ආකාරයකට අඳින්න. මේ අනුව ඒකාධිකරුවාගේ ප්‍රමාණය හා මිළ පෙන්නුම් කරන්න.
ii. මේ රූප සටහනම නැවත ඇඳ පාරිභෝගික අතිරික්තය නිෂ්පාදනය අතිරික්තය හා ගනුදෙනු සීමා වීමෙන් හටගන්නා පිරිවැය (Deadweight Loss) ලකුණු කරන්න.
iii. ඔබ ii. සඳහා අඳින ලද රූපය ම නැවත ඇඳ රජය ඒකාධිකරුවාට කෝටාවක් (Qucta) පැනවීම තුළින් ගනුදෙනු සීමාවෙන් හටගන්නා පිරිවැය අඩු වන බව පෙන්නුම් කරන්න.

(එක් කොටසකට ලකුණු 4)

ඇ) ඒකාධිකරුවකුට මිල විභේදනය කිරීමට අවස්ථාවක් පවතී. මිල විභේදනයට අදාළ වන පහත දී ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

i. මිල විභේදනය යන්නෙන් කුමක් අදහස් වේද?
ii. පූර්ණ මිල විභේදන යටතේ ගනුදෙනු සීමා වීමෙන් හටගන්නා පිරිවැයට කුමක් සිදුවේද?
iii. මිල විභේදනය යටතේ ඒකාධිකරුවකු නම්‍යතාව ආශ්‍රයෙන් මිල තීරණය කරන ආකාරය සඳහන් කරන්න.

(එක් කොටසකට ලකුණු 3)

8.

පහත දී ඇති මාතෘකා අතුරින් ඕනෑම හතරක් (4) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. රේඛීය නිෂ්පාදන හැකියා වක්‍රය
ii. කතිපයාධිකාරී වෙළඳපොලක සැඟවුණු හවුලක (Tacit Collusion) බලපෑම
iii. ඒකාධිකාරී තරගය යටතේ මිල නොවන තරගය
iv. ස්වභාවික ඒකාධිකාරය
v. නිර් උපයෝගීතාවය
vi. වෙළෙඳ ප්‍රචාරණයේ (Advertising) කාර්යභාරය
vii. කාර්යක්ෂමතා වැටුප්

(එක් කොටසකට ලකුණු 6.25)

******************************************************************************